# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2026 මාර්තු 25 |


*මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක. 02 –2026 මාර්තු*

## ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගනී

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය ඊයේ පැවති සිය රැස්වීමේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75%ක් ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කළේය. මැදපෙරදිග කලාපයේ පවතින යුද්මය තත්ත්වය හේතුවෙන් පැන නඟින අවිනිශ්චිතතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, වෙනස්වන දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම පිළිබඳව මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මෙම තීරණයට එළැඹිණි.

භූ දේශපාලනික අර්බුද තීව්‍ර වීමත් සමඟ උද්ගත වූ දැඩි අස්ථාවරත්වය මධ්‍යයේ ගෝලීය බලශක්ති මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යෑම සහ ජාත්‍යන්තර වෙළඳ කටයුතුවලට ඇති වූ අවහිරතා හේතුවෙන් දේශීය බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට සිදුවිය. උද්ධමනය ඉලක්කගත මට්ටම වන 5%ට සාපේක්ෂව, පෙබරවාරි මාසයේ දී 1.6%ක් ලෙස (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) දැනට පහළ මට්ටමක පවතින බැවින්, බලශක්ති මිල ගණන් ඉහළ යෑම සහ එමගින් උද්ධමනය කෙරෙහි එල්ල කරන වක්‍ර බලපෑම් සඳහා මුහුණ දීමට ප්‍රමාණවත් අවකාශයක් පවතී. පවතින නවතම දත්ත සහ අවිනිශ්චිතතා සැලකිල්ලට ගත් විට, උද්ධමනය අපේක්ෂාකළ කාලයට පෙර, එනම් 2026 වසරේ දෙවන කාර්තුව වන විට ඉලක්කගත මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කරයි. ඉන් අනතුරුව එය ඉලක්කගත මට්ටම වටා ස්ථායීව පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ.

2025 වසර අවසානයේ දී දිට්වා සුළි කුණාටුවෙන් බලපෑම් එල්ල වුව ද, එම වසරේ දී ආර්ථිකය 5.0%ක ශක්තිමත් මූර්ත වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන ආර්ථික දර්ශක අනුව, 2026 වසර මුල් භාගයේ දී සුළි කුණාටුවෙන් පසු ආර්ථිකය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වෙමින් පවතින බව පෙන්නුම් කරයි. කෙසේ වුව ද, මැදපෙරදිග කලාපයේ පවතින ගැටුම්කාරී තත්ත්වය අඛණ්ඩව පැවතුණහොත් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වෙත එමගින් එල්ල වන අහිතකර වක්‍ර බලපෑම් ඉදිරි කාලයේ දී තීව්‍ර විය හැකිය.

2026 වසරේ මුල් කාලය තුළ විදේශීය අංශය යහපත් කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, ආනයන වියදම්වලට සාපේක්ෂව අපනයන ආදායම් ඉහළ යෑම මෙන්ම, සංචාරක ඉපැයීම් සහ විදේශ ප්‍රේෂණ ලැබීම්

ඉහළ යෑම ඊට හේතු විය. 2026 වසරේ පෙබරවාරි මාසය වන විට දළ නිල සංචිත[1] එක්සත් ජනපද ඩොලර් බිලියන 7.3ක් දක්වා ඉහළ ගිය අතර, වසරේ මුල් මාස දෙක තුළ මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී. කෙසේ වුව ද, මැදපෙරදිග කලාපයේ පවතින ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන්, විශේෂයෙන් බලශක්ති, සංචාරක, වෙළඳ, සහ ප්‍රේෂණ හරහා ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ඉදිරි දැක්ම කෙරෙහි බලපෑම් එල්ල වීමේ අවදානමක් පවතින නමුත් එහි සමස්ත බලපෑම තවදුරටත් අවිනිශ්චිතව පවතී. 2026 වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂ වශයෙන් ස්ථායීව පැවතිය ද මැදපෙරදිග කලාපයේ ගැටුම් ආරම්භ වීමත් සමඟ කලාපයේ අනෙකුත් රටවල විනිමය අනුපාතිකවල දක්නට ලැබුණු ආකාරයෙන්ම ශ්‍රී ලංකා රුපියලෙහි ද යම්කිසි අවප්‍රමාණය වීමේ පීඩනයක් නිරීක්ෂණය විය.

ආර්ථිකය එහි උපරිම ධාරිතා මට්ටමට ළඟා වීම සඳහා සහාය වන අතරම, උද්ධමනය ඉලක්කගත මට්ටමේ ස්ථාවර වීම තහවුරු කිරීමට සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සූදානම්ව සිටියි.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2026 මැයි 26වන දින නිකුත් කිරීමට නියමිතය.

දත්ත ඇමුණුම වෙත ප්‍රවේශය: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/mpr02_2026_s.pdf

[1] චීන මහජන බැංකුවෙන් හිමි වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද මීට ඇතුළත් වේ.

## ඇමුණුම 01:

***පහත ඉදිරිපත් කර ඇති පුරෝකථන 2026 මාර්තු 24 වැනි දිනට ලැබී ඇති තොරතුරු මත පදනම් වේ. මැදපෙරදිග කලාපයේ පවතින අර්බුදයේ නිරන්තර වෙනස්වන ස්වභාවය සහ ගෝලීය මෙන්ම දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එමගින් ඇතිවන පුළුල් බලපෑම් මධ්‍යයේ, වත්මන් උද්ධමන ඉදිරි දැක්ම සඳහා ඉහළ අවිනිශ්චිතතාවක් පවතී. ඒ අනුව, පුරෝකථන සඳහා පදනම් වූ තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවුවහොත් මෙම පුරෝකථනවලින් සැලකිය යුතු අපගමනයක් සිදු විය හැකිය.***

**මතුපිට උද්ධමනයේ පුරෝකථන* (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)**

2026 මාර්තු මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව




*මූලය: මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

*** 2023 ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි (Fan chart) වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021 = 100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. 2026 මාර්තු මස පුරෝකථන වාරයේ දී පැවති සියලුම දත්ත මත පුරෝකථන පදනම් වේ.

සටහන : උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කරමින් විදහා දැක්වේ. රූපසටහනෙහි දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේ දී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

***සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.***

මෙම පුරෝකථන, 2026 මාර්තු මස පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මත පදනම්ව සිදු කර ඇත. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපේක්ෂිත ආර්ථික වර්ධනය, රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම, විදේශීය ජංගම ගිණුමේ ශේෂය ඇතුළුව විදේශීය අංශයේ අපේක්ෂිත ප්‍රවණතා සහ එක්සත් ජනපද මුදල් ප්‍රත්පත්ති පොලී අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යන කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති සමග අනුකූල වන පොලී අනුපාතික මාර්ගය සහ ඒ හා සබැඳි සාර්ව ආර්ථික විචල්‍යයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය.

ගෝලීය භාණ්ඩ වෙළඳපොළ, බලශක්ති සැපයුම් සහ නැව් මාර්ග කෙරෙහි බාධා ඇති වීම තුළින් දේශීය බලශක්ති හා ප්‍රවාහන වියදම් සහ පොහොර වියදම් අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ යාමට හේතු විය හැකි, තීව්‍ර වූ භූ දේශපාලනික අර්බුද; ශ්‍රී ලංකා රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණ වීමට ඇති හැකියාව; ඉහළ ණය වර්ධනයේ පසු බලපෑම හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ ඉල්ලුම් පීඩන ඇතිවීමේ හැකියාව; කෘෂිකාර්මාන්ත සහ බලශක්ති අංශවලට බලපෑම් සිදුවන අහිතකර කාලගුණික තත්ත්වයන් නිරන්තරයෙන් ඇතිවීමේ හැකියාව හා එමගින් ආහාර හා බලශක්ති උද්ධමනය මත ඉහළ පීඩන ඇතිවීම වැනි සාධක මගින් වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථනවලට වඩා ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථනවලට වඩා පහළ යෑමේ බලපෑම් සැලකූ විට, ඉල්ලුම් තත්ත්ව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා දුර්වලව පැවතීමේ හැකියාව සහ එමගින් මූලික උද්ධමනය යථා තත්ත්වයට පත්වීම අඩු වේගයකින් සිදු වීම, සහ ආහාර මිල ගණන් මත පීඩන ලිහිල් කිරීමට උපකාරී වන කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිදියුණු වීමට ඇති හැකියාව ඇතුළත් වේ.